13(2)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2021-02-18

පැමිණිලි පාර්ශවය : අමරා ගුණවර්ධන මිය,
රත්නහැර, කනත්තගොඩ,
මාතර.

වගඋත්තරකාර පාර්ශවයවන් : 01. උ.පො.ප. පෙරේරා මයා,
පොලිස් ස්ථානය,
වැලිගම.

02. පො.සැ. 24814 දිනිජ මයා,
පොලිස් ස්ථානය,
වැලිගම.

03. පො.කො. 29936 මධුසංක මයා,
පොලිස් ස්ථානය,
වැලිගම.

04. පො.කො. 90498 දිල්රුක් මයා,
පොලිස් ස්ථානය,
වැලිගම.

**පැමිණිලි අංකය : HRC/MT/355/17**

**පැමිණිල්ල :-**

උක්ත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම පුතා වන පි.ඩි.උදේශ් මලිත ලක්ෂාන් නැමති අය මාවරල පොලිස් ස්ථානය මඟින් 2017.10.15 වන දින අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයේදී පහරදී 2017.10.17 දින දක්වා රඳවා තබා ගෙන අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 සහ 13 වන ව්‍යවස්ථා මඟින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවයි.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඒ අනුව තම පුතු වන පී.ඩී.උදේශ් මලිත ලක්ෂාන් 2017.10.15 වන දින දහවල් 12.00 ට පමණ මාවරල පොලිසියේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන එදිනම සවස වැලිගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇති බවත්, තමා මෙම පැමිණිල්ල ඉදිරිපත් කරන 2017.10.17 දින වන විටත් තම පුතු රඳවාගෙන නොකල වැරදි භාර ගැනීමට බලකරමින් අමානුෂික ලෙස දඬුවම් කරන බවත් දන්වා ඇත.

**වින්දිතගේ ප්‍රකාශය :-**

2017.11.10 වන දින වින්දිත උදේශ් මලිත ලක්ෂාන් යන අය කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දෙමින් දන්වා ඇත්තේ 2017.10.15 දින මාවරල පොලිසියෙන් පැමිණ බයික් එක රැගෙන ගිය බවත්, සිවිල් ඇඳුමින් සැරසුනු නිලධාරීන් හය දෙනෙකු පැමිණ තමාව මාංචු දමා ජීප් රථයෙන් පොලිසියට රැගෙන ගිය බවත් අත්අඩංගුවට ගැනීමට හේතුවක් තමන් නොදන්නා බවත්ය.

පසුව දැනගත් පරිදි විදේශ කාන්තාවකගේ අත්බෑගයක් සොරකම් කිරීමට අදාළව බව දැනගත් බවත් මාවරල පොලිසියෙන් එදින සවස 6.00 ට පමණ තමා වැලිගම පොලිසියට පෞද්ගලික වෑන් රථයකින් ගෙන ආ බවත්, ඊට වැලිගම පොලිසියේ පෙරේරා, සොයිසා හා දිල්රුක් යන නිළධාරීන් පැමිණි බවත්, දන්වා ඇත.

එසේ රැගෙනවිත් කූඩුවට දැමූ බවත්, පසුදින උදේ එනම් 2017.10.16 දින උදේ 6.30ට පමණ පෙරේරා මහතා පිටුපස කළුවර කාමරයකට රැගෙනගොස් "සුද්දියක්ගේ බෑග් එකක් කඩා ගත්තා කියලා පෙර වැරැද්දක් තියෙනවා, ඒ නඩු තුන භාර ගනින්" කියමින් බෙල්ලට කොන්දට 2cmx2cm ප්‍රමාණයේ ලීයකින් පහරවල් 20ක් 25 ක් ගැසූ බවත් හොරකම ගැන තමා නොදන්වා බව දැන්වූ සෑම අවස්ථාවකම පහරදුන් බවත්, පසුව රාත්‍රී 7.00 ට පමණ කූඩුවට දමා නැවත රාත්‍රී 8.30 ට පමණ එළියට ගෙන අපරාධ අංශයේ කවුරුවත් නැති තැනකදීද පහරදුන් බවත් සඳහන් කර ඇත. එහි පෙරේරා මහතා හා තවත් මහත්මයෙක් සිටි අතර තම නිවසින් ආ විට "පහරදුන් බව කිව්වොත් බෝම්බයක් දමා අවුරුදු ගානකට ඇතුළට දාන බවට" තර්ජණය කළ බවත්, තවද තමා බැලීමට නිවැසියන් පැමිණි බවද දක්වා ඇත.

පසුව තමාගේ මිතුරෙකු වන ඩිල්ශාන්ද අත්අඩංගුවට ගෙන ආ බවත්, පෙරේරා හා සොයිසා මහතා තමන් දෙදෙනා පොලිස් ස්ථානයේ පිටුපසට රැගෙන ගොස් තුවක්කුවක් තමාගේ කටට දික්කර "වරද භාරගනින් නැත්නම් වෙඩි තියනවා" යයි කියූ බවත් පසුව තමාට බිත්තිය අල්ලා ගන්න කියා විකට් පොල්ලෙන් පිටට බෙල්ලට හා අතට පැයක් දෙකක් පහරදුන් බවත්, පහරදීම ඉවසා ගත නොහැකිව වරද භාරගත් බවත් ප්‍රකාශ කර ඇත.

නැවතත් 2017.10.16 දින රාත්‍රියේද වරද භාරගනින් කියා පහරදුන් බවත් පසුදින එනම් 2017.10.17 දින දහවල් 11.30 ට 12.00 ට පමණ අධිකරණයට ගෙන යද්දි මානව හිමිකම් ගියා කියා නැවතත් පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත.

තමාට මෙම නිළධාරීන් පහරදුන් බව මහේස්ත්‍රාත්වරයාට හා බන්ධනාගාර නිළධාරීන්ට ප්‍රකාශ කළ බවත් තම මිතුරා වන ඩිල්ෂාන් යන අයට 2017.10.16 දින උදේ 8.30 ට පමණ ඇප ලබාදුන් බවත් තමා බන්ධනාගාර රෝහලේ දින 6ක් ප්‍රතිකාර ලද බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැලකිරීම් :-**

**මාවරල පොලිස් ස්ථානය**

මාවරල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් 2018.01.22 දාතමින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව හා උදෑත අනුව උදේශ් මලිත ලක්ෂාන් යන අය 2017.10.15 දින පැය 15.45 ට ගොමිල ග්‍රාම නිළධාරි කාර්යාලය අසලදී සැකපිට ප්‍රශ්න කිරීම සඳහා අත්අඩංගුවට ගෙන මෙම අය අපරාධ සඳහා අවශ්‍ය අයකුද යන්න පරීක්ෂා කර එසේ නොවන බව අනාවරණය වීමෙන් පසු දැනුම් දුන් විටකදී පොලිස් ස්ථානයේ පෙනී සිටින ලෙස දන්වා පුද්ගලික ඇප මත එදින පැය 18.30 ට ඇප මත නිදහස් කර ඇති බව දක්වා ඇත.

**වැලිගම පොලිස් ස්ථානය**

මුලස්ථාන පො.ප. වැලිගම විසින් 2017.11.21 වන දිනැති සිය වාර්තාව මඟින් දන්වා ඇත්තේ, රුසියානු ජාතික කාන්තාවක් වන මරිනා ස්කුවා විසින් තම අත්බෑගය කොල්ලකෑම සම්බන්ධව සිදු කර ඇති පැමිණිල්ලට අදාළව මුලික විමර්ශන කටයුතු සිදු කළ බවත් කොල්ලකරුගේ යතුරු පැදියේ අංකය මත පරීක්ෂණ පවත්වා ඊට අදාළ සැකකරු වන පි.ඩබ්. උදේශ් මලිත ලක්ෂාන් යන අය 2017.10.17 වන දින වැලිගම පොලිස් වසමේ මිරිස්ස ප්‍රදේශයේදී යතුරු පැදිය සමඟ අත්අඩංගුවට ගෙන නඩු භාණ්ඩ සමඟ මාතර ම/උ බී ආර් 3550/17 හා 3551/17 යටත් අධිකරණයට ඉදිරිපත් කරන ලද බවයි.

වැලිගම පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ 2017.10.17 දින පැය 7.05 ට පිටු 6 ඡේද 90 යටතේ උ.පො.ප පෙරේරා, උ.පො.ප තාරුන්ද හා පො.සැ. 24814 දිනිජ, පො.කො. 39936 මධුශංක ,පො.කො. 90498 දිල්රුක්, පො.සැ. 19931 සරත් සහ පො.කො. 68856 ලලංග යන නිලධාරීන් මෙම අත්අඩංගුවට ගැනීමට පිටව ගොස් පැය 8.10 ට උඩුපිල බෝල කෝඩ් එක අසලදී මෙම වින්දිත අත්අඩංගුවට ගෙන ඇති බවත්, නඩු භාණ්ඩද සොයා ගෙන ඇති අතර ඒවාද නිවැරදි ලේඛනගත කර ඇති බවත් දක්වා ඇත.

උපසේවක පො.සැ. 3369 විසින් සැකකරු භාරගෙන ඇති අතර තුවාල කිසිවක් මතුපිටින් පෙනීමට නොමැති බවට සටහන් කර ඇත. මෙම සැකකරු පැය 12.10ට අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර 2017.10.26 දක්වා බන්ධානාගර ගත කළබවත් දක්වයි.

**1 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම (උ.පො.ප පෙරේරා) :-**

පැමිණිල්ලේ පළමු වගඋත්තරකාර උ.පො.ප. පෙරේරා යන අය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 143/17 බල අපරාධ යටතේ GCIB තොරතුරු පොතේ 398/80 පරිදි 2017.10.15 දින පැය 8.00 ට රුසියානු ජාතික මරිනා ස්වේරා යන අය විසින් තම අත්බෑගය සොරකම් කළ බවට දන්වමින් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් හා 2017.10.02 දින චීන ජාතික ලිවු ෂිංගේ යන අයගේ GCIB 241/88 දරණ පැමිණිල්ලට අදාල සැකකරුවන් සොයා 2017.10.17 දින පැය 7.05 ට පොලිස් ස්ථානයෙන් පිටව ගොස් උඩුපිල බොල් කෝඩ් එක අසලදී පැය 8.10 ට පි.ඩී. උදේශ් මලිත ලක්ෂාන් යන අයට අත්අඩංගුවට ගත් බවත් එම ස්ථානයේ සිටම ප්‍රකාශ ලබා ගෙන එම ප්‍රකාශ වලට අනුව සොරකම් කරන ලද ජංගම දුරකථන දෙක, රිදී මුද්ද හා කොල්ලකෑමට

යොදා ගත් බව කියන XO 7747 දරණ යතුරු පැදිය සොයා ගත් බවත් ඒවා නඩු භාණ්ඩ ලෙස ඇතුළත් කර එදිනම පැය 12.40ට මාතර ම/උ BR 3550/17 හා BR 3551/17 යටතේ අධිකරණයට ඉදිරිපත් කළ බවත්ය.

**පැමිණිලි පාර්ශවයේ සාක්ෂි :-**

පැමිණිලි පාර්ශවය වෙනුවෙන් හෙට්ටිආරච්චි ගමගේ පියුමි නතාෂා වන වින්දිත උදේශ් මලිත ලක්ෂාන් යන අයගේ බිරිඳ සාක්ෂි ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2017.10.15 දින දහවල් 12 ට පමණ නිවසේ දිවා ආහාරය ගැනීමට සූදානම්ව සිටින විට සිවිල් ඇඳුමින් සැරසුනු මාවරල පොලිස් ස්ථානයේ නිලධාරීන් දෙදෙනෙකු තම ස්වාමිපුරුෂයා වැලිගම පොලිස් ස්ථානය වෙත භාර දෙන බවට දන්වා කැඳවාගෙන ගිය බවත්, එදින සවස 5.00 ට පමණ තමාත් තම මවත්, තම ස්වාමියාගේ පුංචි අම්මාත් වැලිගම පොලිස් ස්ථානය වෙත ගිය බවත්, එහිදි තම ස්වාමිපුරුෂයා එහි නොමැති බව පැවසූ බවත් නැවත තමා සහ මව මාවරල පොලිස් ස්ථානය වෙත ගිය විට වැලිගම පොලිස් ස්ථානයට ගෙන ගිය බව දැනගත් බවත් පසු දින වන තෙක් එනම් 2017.10.16 දින දක්වා තම ස්වාමියා නොපෙන් වූ බවත් 2017.10.17 වන තෙක් දින තුනක් රඳවා තබා ගත් බවත් සඳහන් කර ඇත.

වින්දිතගේ මව වන එම්.ජේ.කේ. අමරා ගුණවර්ධන යන අය විසින් සාක්ෂි ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2017.10.15 වන දින දවල් 12.00 ට පමණ තම පුතා මාවරල පොලිස් ස්ථානයට ගෙන ගිය බවට පුතාගේ බිරිඳ විසින් දුරකථනය මඟින් දන්වා සිටි බවත් වැලිගමට භාරදෙන බව මාවරල පොලිස් ස්ථානයේ නිලධාරීන් කියූ බැවින් ඒ අනුව තමාත් තම අක්කා වන ඩිස්ලින් ගුණවර්ධන සහ පුතාගේ බිරිඳත් ඇයගේ මවත් වැලිගම පොලිස් ස්ථානයට ගිය බවත් එහිදී පුතා රැගෙන නොආ බව කියූ බැවින් නැවත පුතාගේ බිරිඳ මාවරල පොලිස් ස්ථානය වෙත ගිය විට පුතා වැලිගමට ගෙන ගිය බව දන්වා බවත්ය. පසුදින එනම් 2017.10.16 දින උදේ 8.30 ට තමාත් ඩිසිලින් ගුණවර්ධනත්, පුතාගේ බිරිඳත් මවත් වැලිගම පොලිස් ස්ථානය වෙත ගිය විටදි පුතා සිර කූඩුවේ සිටි බවත් ඇපල් ෆෝන් එකක් අරගෙන තියෙනවා කියලා එය ඉල්ලමින් පහරදුන් බව ප්‍රකාශ කළ බවත් පසුව 2017.10.17 වන දින උදේ මානව හිමිකම් කොමිෂන් සභා කාර්යාලයෙන් දැනුම් දීමෙන් පසුව දහවල් අධිකරණයට ඉදිරිපත් කර 2017.10.26 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත් සඳහන් කර ඇත.

ඩිස්ලින් ගුණවර්ධන යන අය වින්දිතගේ ලොකු අම්මා වන අතර ඇය විසින් ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, 2017.10.15 දින තම නැගණියගේ පුතා වන උදේශ් මලිත ලක්ෂාන් මාවරල පොලීසියෙන් අත්අඩංගුවට ගෙන වැලිගම පොලිස් ස්ථානයට භාර දෙන බවට ලේලිය විසින් ලබා දෙන ලද දුරකථන පණිවුඩයට අනුව තමා සහ තම නැගණිය වන අමරා ගුණවර්ධන යන අය සමඟ වැලිගම පොලිස් ස්ථානයට ගොස් සවස 6.00 වන තෙක් රැදී සිටි නමුත් එදින පුතා වැලිගම පොලිස් ස්ථානයට ගෙන නොආ බව දන්වන ලද බවත් නැවත 2017.10.16 දින උදේ වැලිගම පොලීසියට යන විට පුතා කූඩුවේ සිට කතා කළ බවත්ය. එහිදී උදෑසන කාලයේදී පහරදීමක් නොකළ බවට ප්‍රකාශ කරන ලද නමුත් දහවල් ආහාර ලබා දීමට ගිය විට 'හොඳටම ගැහුවා' කියමින් හැඬූ බවත් පසු දින එනම් 2017.10.17 දින මම පොලිස් ස්ථානයට නොගිය නමුත් ඔහුව අධිකරණයට ඉදිරිපත් කළ බව දැනගත් බවත් සඳහන් කර ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු :-**

පැමිණිලිකාර අමරා ගුණවර්ධන යන අය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2017.10.17 දින සිදු කරන ලද පැමිණිල්ලට අනුව කොමිෂන් සභාවේ විමර්ශන නිළධාරි පී.ඒ.කේ. සිරිවර්ධන මහතා වැලිගම පොලිස් ස්ථානය වෙත පෙරවරු 9.20ට දුරකථනය මඟින් අමතා ඇති අතර එහිදී උ.පො.ප. පෙරේරා මහතා විසින් දැනුම් දී ඇත්තේ වින්දිත එදින අධිකරණය වෙත ඉදිරිපත් කරන බවයි.

සැකකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ 2017.10.15 දින මාවරල පොලිස් ස්ථානය මඟින් වන අතර වාර්තා හා උද්ෘත අනුව අනාවරණය වන්නේ මෙම වින්දිතයා 2017.10.15 දින පැය 15.45 ට සැකපිට අත්අඩංගුවට ගෙන පැය 18.30 ට පුද්ගලික ඇප මත මුදා හැරි බවයි.

සැකකරු 2017.10.15 සවස මාවරල පොලිස් ස්ථානය මඟින් ඇප පිට නිදහස් කිරීමෙන් පසුව වැලිගම පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගෙන 2017.10.16 හා 2017.10.17 දින දක්වා පොලිස් ස්ථානයේ රඳවා තබාගෙන ඇති අතර 2017.10.17 දින BR 3550/17 හා BR 3551/17 යටතේ චෝදනා 02 ක් මත අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු 2017.11.09 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති බවද නිරීක්ෂණය වේ.

වැලිගම පොලිස් ස්ථානයේ කරුණු වාර්තා හා උද්ෘත සටහන් පරිදි උදේශ් මලිත ලක්ෂාන් යන අය අත්අඩංගුවට ගෙන ඇත්තේ 2017.10.17 දින පැය 8.10ට වන අතර සොරාගත් භාණ්ඩ සොයා ගෙන එදිනම පැය 12.40 ට අධිකරණයට ඉදිරිපත් කර ඇති බවට දක්වා ඇත. තවද ස්ථානයට පැමිණීමේ සටහන් යොදා ඇත්තේ, 11.02ටය. නමුත් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් පැමිණිලිකාරියගේ පැමිණිල්ල මත පෙ.ව 9.20 ට උ. පො.ප පෙරේරා යන අය අමතා ඒ පිළිබඳව විමසා ඇති අතර, එහිදී අත්බෑගයක් සොරකම් කිරීමේ වරදට අත්අඩංගුවට ගෙන ඇති බව දන්වා ඇත. ඒ අනුව එහිදී අත්අඩංගුවට ගෙන ඒ වන විටත් ස්ථානයට ඉදිරිපත් නොකළ සැකකරුවෙකු පිළිබඳ කරුණු දැක්වීම ගැටළු සහගත වන අතර, එමඟින් මෙම සැකකරු ඊට පෙර අත්අඩංගුවට ගෙන ඇති බවට අනුමාන කළ හැක.

මෙම වින්දිත උදේශ් මලිත ලක්ෂාන් යන අයට පහරදීම සම්බන්ධ චෝදනාව උ.පො.ප. පෙරේරා, පො.සැ. දිනිජ, පො.කො. මධුශංක, පො.කො. ඩබ්.එන්. දිල්රුක් යන නිලධාරීන් විසින් 2018.03.22 හා 2018.05.11 යන දින වලදී මෙම කොමිෂන් සභාව හමුවේ පැවැති පරීක්ෂණයේදී ප්‍රතික්ෂේප කර ඇත.

පහරදීම පිළිබඳව වින්දිත විසින් බන්ධනාගාරයට ප්‍රකාශයක් ලබා දුන් බව ප්‍රකාශ කර ඇතත්, 2018.01.28 දිනැති සහකාර බන්ධනාගාර අධිකාරි මාතරගේ මා/විලි/21/8 දිනැති ලිපියෙන් දන්වා ඇත්තේ පහරදීමකට අදාළව ප්‍රකාශයක් මෙම පැමිණිලිකරු විසින් සිදු කර නොමැති බවයි.

බන්ධනාගාර රෝහල මඟින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ඇති බවට උද්ෘත යොමු කර ඇතත් ඒ කුමන හේතුවකටද යන්න පිළිබඳ අනාවරණය නොවේ. පැමිණිල්ලෙන් ප්‍රකාශ වන ඩිල්ෂාන් නැමති සාක්ෂිකරු කොමිෂන් සභාව වෙත සාක්ෂි ලබා දීම සඳහා ඉදිරිපත්ව නොමැති බැවින් හා ප්‍රතිකාර සඳහා රෝහල්ගතව නොමැති බැවින් පහරදීම සනාථ නොවන අතර, නීත්‍යානුකූල නොවන කාලයක් රඳවා තබා ගෙන ඇති බව අනාවරණය කර ගත හැකි වේ.

**නිගමනය :-**

පැමිණිලිකාරිය විසින් සිය පැමිණිල්ල මඟින් ඉදිරිපත් කර ඇති පහර දීමේ චෝදනාව සනාථ කිරීම සඳහා අධිකරණ වෛද්‍ය වාර්ථා, බන්ධනාගාර ප්‍රකාශ හෝ ඇසින් දුටු සාක්ෂි මඟින් කරුණු ඉදිරිපත් කර නොමැති බැවින් පහරදීම තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැත.

එහෙත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ප්‍රකාශ සහ පොලිස් ස්ථානයේ යොදා ඇති සටහන් අනුව 2017.10.15 දින අත්අඩංගුවට ගෙන 2017.10.17 දින අධිකරණයට ඉදිරිපත් කර ඇති බවට කරුණු තහවුරු වන බැවින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු දින 1 ½ ක් රඳවා සිටීම පිළිබඳ 01 02 03 හා 04 වන වගඋත්තරකරුවන් වගකීමෙන් බැඳෙන බව කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වේ.

<u>**ලන්දගේ ඉෂාරා අංජලී සහ විජේසිංහ චූලාංගනී**</u> එදිරිව <u>**වරුණ බෝගහවත්ත සහ වෙනත් අය**</u> <u>**SCFR 677/2012**</u> නඩුවේදී, "13 වන ව්‍යවස්ථාව මඟින් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් නිදහස් වන අතර, නිදහස අහිමි කිරීම නීතියෙන් ස්ථාපිත කර ඇති ක්‍රියා පටිපාටිය දැඩි ලෙස අනුගමනය කළ යුතු බවට නියෝග කරයි. මෙම ක්‍රියාපටිපාටියේ ආරක්ෂක විධිවිධාන සකසා ඇත්තේ අභිමතය පරිදි හෝ පාලනයෙන් පාලනය නොකිරීමට සහ පුද්ගල වාසි සහ දේශපාලන අරමුණු සඳහා අධිකරණ බලය අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීමට" වන බවද දක්වා ඇත.
එසේම, <u>**කපුගීකියනගේ**</u> එදිරිව <u>**හෙට්ටිආරච්චි සහ වෙනත් අය**</u> **(1984) 2 SLR 153** නඩුවේදී "අත්අඩංගුවට ගැනීමේදී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි සඳහන් නීතිය මඟින් ස්ථාපිත කරන ලද ක්‍රියාපටිපාටිය හැර වෙනත් ක්‍රියාපටිපාටියක් අදහස් කළ නොහැක" යනුවෙන් දක්වා ඇත.

මේ අනුව එකී ක්‍රියාව නීතියේ නියමකර ඇති ආකාරයට පරිබාහිරව රඳවා තබා ගැනීමක් වන අතර, ඒ අනුව සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රඳවා තබා ගත හැකි පැය 24 ක කාලයක් ඉක්මවීමක් තහවුරු කරනු ලබන අතර, එමඟින් වින්දිත උදේශ් මලිත ලක්ෂාන් වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 13(2) වගන්තිය මඟින් තහවුරු කර දී ඇති විනිශ්චයකාරවරයෙකුගේ ආඥාවකින් මත හැර අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමෙන් වැළකීමේ නිදහස යන අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව පෙනී යයි.

**නිර්දේශය :-**

01. ඒ අනුව එක් නිලධාරියෙකු රු 5000.00 බැගින් රු 20,000.00 ක වන්දි මුදලක් අගතියට පත් පාර්ශවය වෙත ගෙවිය යුතුය.

02. සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති, නීතිපති සහ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතද යොමුකරනු ලැබේ.

2021.03.18 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Kar
Commissione
Human Rights Commissi

පිටපත :- 01. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව,
අලුත්කඩේ, කොළඹ 12.

03. සභාපති ,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

**සැ.යු :- අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.**

B/